රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 8/2015

මගේ අංකය: ADD.SEC/INV/ELE2015
රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2015.03.30

සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
පළාත් සභා හා පළාත් පාලන ආයතන ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## රාජ්‍ය සේවාවන්ට අදාළ මැතිවරණ අක්‍රමිකතා විභාග කිරීමේ විශේෂ කමිටුව

2015 ජනාධිපතිවරණයට පෙර හා පසුව වාර්තා වී ඇති රාජ්‍ය සේවාවන්ට අදාල මැතිවරණ අක්‍රමිකතා සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා අංක 15/0111/610/004 හා 2015.02.25 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉහත සඳහන් විශේෂ කමිටුව පත් කරනු ලැබ ඇත.

02. මේ සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීමටත්, ඔවුන් වෙත ඇති තොරතුරු කමිටුවට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සඳහාත් සකස් කරන ලද දැන්වීමක ආකෘතියක් මේ සමඟ එවා ඇති අතර එය අඟල් 15 x 20 ප්‍රමාණයෙන් සකස් කර ඔබ කාර්යාලයේ දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනය කරන ලෙස දන්වමි.

03. උක්ත කමිටුවේ සාමාජිකයන් හෝ එම කමිටුව යටතේ සේවය කරන විමර්ශන නිලධාරීන් යම් පැමිණිල්ලක් සම්බන්ධව විමර්ශනය කිරීම සඳහා ඔබ ආයතනයට පැමිණෙන්නේ නම් ඔවුනට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා පහත සඳහන් පහසුකම් සලසන මෙන් කාරුණිකව දන්වමි.

I. ඔබ ආයතනය යටතේ පවත්නා ගොනුවක ඇතුළත් යම්කිසි ලිපි ලේඛනවල පිටපත් ලබා ගැනීමට අවශ්‍ය වන විට ඒවා "සත්‍ය පිටපත්" යනුවෙන් මාණ්ඩලික නිලධරයෙකු මඟින් සහතික කර නිකුත් කිරීම.

II. ඉහත "I" පරිදි විමර්ශනයට ලක් කරන ලද ගොනුවල ආරක්ෂාව සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

III. එම ආයතනය යටතේ පවත්නා යම්කිසි ගොනුවක් කමිටු සාමාජිකයන්, විමර්ශන නිලධාරීන් භාරයට ගැනීමට අවශ්‍ය වන විට ඒ පිළිබඳව ලිඛිත සටහනක් ලබා ගැනීමෙන් අනතුරුව අදාළ ගොනු එම නිලධාරීන් වෙත ලබා දීම.

IV. යම් කරුණක් සම්බන්ධයෙන් ඔබගේ ආයතනය යටතේ සේවය කරන නිලධාරියෙකුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීමට අවශ්‍ය වන අවස්ථාවල දී ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම.

V. විමර්ශනයන්ට අදාළව ඔබගේ ආයතනය ස්ථානීය පරීක්ෂාවක් සිදු කිරීමට අවශ්‍ය අවස්ථාවන් හිදී ඒ සඳහා කමිටු සාමාජිකයන්ට/ විමර්ශන නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් ලබා දීම.

04. මෙම චක්‍රලේඛණයේ සඳහන් විධි විධාන පිළිබඳව ඔබ ආයතනය යටතේ ඇති සියලු ම ආයතනවල ප්‍රධානීන් දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් දන්වමි.

05. මෙම කමිටුව විසින් යම් නිලධරයෙකු කමිටුව ඉදිරියට කැඳවා ප්‍රකාශයක් ලබා ගැනීමට අදහස් කළහොත්, අදාල නිලධාරියා කමිටුව විසින් නියම කරනු ලබන දිනයක දී එසේ ප්‍රකාශය ලබා දීම සඳහා කමිටුව ඉදිරියට පැමිණවිය යුතුයි.

06. රාජ්‍ය සේවාවන්ට අදාල මැතිවරණ අක්‍රමිකතා විභාග කිරීමේ විශේෂ කමිටුවේ කාර්යභාරය සාර්ථක කර ගැනීමටත්, නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීමට අවශ්‍ය පසුබිම සැකසීමටත් ඔබගේ දායකත්වය අතිශයින් අගය කරමි.



ජේ. දඩල්ලගේ
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය

# දැන්වීම

**"නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා වගකීම ඉටු කරමු"**

2015 ජනාධිපතිවරණයට පෙර හා පසුව වාර්තා වී ඇති පහත සඳහන් කරුණු ආශ්‍රිත පැමිණිලි සම්බන්ධව විමර්ශනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමා විසින් විශේෂ වූ කමිටුවක් පත් කරනු ලැබ ඇත.

1. රාජ්‍ය ආයතන විසින් රාජ්‍ය සම්පත් මාධ්‍ය ප්‍රචාරක කටයුතු සඳහා අවභාවිතය.
2. රජයේ දේපල සාවද්‍ය ලෙස මැතිවරණ කටයුතු සඳහා පරිහරණය.
3. රජයේ මුදල් මැතිවරණ කටයුතු සඳහා අයථා පරිහරණය.
4. රජයේ නිලධාරීන් දේශපාලන කටයුතු වලට යොදවා ගැනීම් හා ඒවායේ යෙදීම් හා
5. වෙනත් ඉහත ආශ්‍රිත මැතිවරණ අක්‍රමිකතා.

ඉහත කරුණු සම්බන්ධයෙන් යම් තොරතුරක් ඔබ වෙත ඇත්නම් 2015 අප්‍රේල් 15 දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලිඛිතව ඉදිරිපත් කළ හැකිය.

සභාපති
රාජ්‍ය සේවාවන්ට අදාල මැතිවරණ අක්‍රමිකතා
විභාග කිරීමේ විශේෂ කමිටුව,
විමර්ශන හා මෙහෙයුම් ඒකකය,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා
ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07